**සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)**

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- --------------------------------------------------------------------------------------

කලාපය- --------------------------------------------------------------------------------------

සාහිත්‍ය දැනුම මිනුම

09 ශ්‍රේණිය

කාලය පැය 02 (මුළු ලකුණු 100)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති ප්‍රකාශ ඇසුරෙන් (අ) කීවේ කවුරුන් විසින් ද? (ආ) කීවේ කා හට ද? (ඉ) කුමන අවස්ථාවේදී ද? (ඊ) උපුටා ගත් පාඩමෙහි නම කුමක් ද ? යන ප්‍රශ්නවලට පිළිවෙලින් පිළිතුරු දක්වන්න.

I "එහෙත් ඉතිරි දරුවන් දෙදෙනා කෙසේ ජීවත් වේද?ඔවුන්ට යන කල දසාව කිම? "

II "ස්වාමීනි,මෙලොව මෙයට වඩා පියයුත්තක් නැතැයි කීය"

**(ලකුණු 5x2 = 10යි)**

**(02) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.**

I ගොඩැල්ලේ තරම දැනගෙන ළිද කපනු
-----------------------------------------------
කඩුල්ලේ තරම දැනගෙන වැට බඳිනු
-----------------------------------------------

II දුක් විඳ දසමස උසුලා වැදුදැයි අපෙ අම්මා
අඳුන් තෙලින් නිති සරසා ඇති කළ දැයි අම්මා
-----------------------------------------------
-----------------------------------------------

III -----------------------------------------------
-----------------------------------------------
මුහුදු දියත් මදෙයි සිතා රස කිරි දුන් අම්මා
සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා

IV මල් පිපෙන පොකුණුද
කඳු ගං කැලෑ කුඹුරුද
-----------------------------------------------
-----------------------------------------------

V මිහිරියි හැමෝටම
සිරි ලංකා කියන නම
-----------------------------------------------
-----------------------------------------------

**(ලකුණු 4x5 = 20යි)**

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I ගුත්තිල කාව්‍ය රචනා කළේ කවුද?-----------------------------------------------------------

II දේශාභිමානී කවි,ගීත රචනා කළ කොළඹ යුගය නියෝජනය කරන කවීන් තිදෙනෙක් නම් කරන්න.
III සද්ධර්ම රත්නාවලිය රචනා කළේ කුමන යුගයේ ද?-------------------------------------------------
IV චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ 03ක් නම් කරන්න.-------------------------------------------------
V මාර්ටින් වික්‍රමසිංහ විසින් රචිත කෘති 02ක් ලියන්න.------------------------------------------

(ලකුණු 2x5 = 10යි)

**(04)පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**නිල් පාටැති වන ලැහැබේ**
**වටිනා මල් බුරුතු තිබේ**
**එහි පිරිසිඳු සුවඳ ලැබේ**
**වාසනාව නොවෙද උඹේ**

**ඇස සනසයි සමනලයා**
**කන පිනවයි කෝකිලයා**
**දිව පොබයයි මී ලොලයා**
**මගෙ පුතුගේ පින් බලයා**

**උඹෙ මී මුත්තන් වැගිරූ**
**ලේ හින්දා වෙමින් සරු**
**රන්වන් පාටයි කුඹුරු**
**දැන ගත යුත පුත රුසිරු**

I වනයේ මල් පිපෙන්නේ කාගේ වාසනාව නිසා ද?----------------------------------------------------
II කවි පන්තියේ දැක්වෙන පරිදි ඇස සනසන්නේ කවුද?----------------------------------------------
III පුතුගේ කන් පිනවන පක්ෂියා කවුද?-------------------------------------------------------
IV කුඹුරු රන් පැහැ වීමට හේතුව ලෙස කවියා දක්වන්නේ කුමක් ද?-----------------------------------
V මෙහි ඔබ හඳුනා ගත් කාව්‍යාලංකාරයක් නම් කරන්න?-------------------------------------------

(ලකුණු 2x5 = 10යි)

**(05) පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.**

I අනුබද්ධ -----------------------
II ගුණානුස්මරණය-----------------------
III අවශේෂ -----------------------
IV දද -----------------------
V සින්දා හළ -----------------------
VI නිල කළහ--------------------------
VII එකුරුත්තේ------------------------
VIII අසත්පථයේ----------------------
IX සිඟු ----------------------
X කෘෂි වණික් ---------------------

(ලකුණු 1x10 = 10යි)

(06) ඔබ දන්නා ප්‍රස්ථාව පිරුළු 10ක් ලියන්න.

(ලකුණු 1x10 = 10යි)

(07) පහත දැක්වෙන රූඩිවල අර්ථය ලියන්න.

I කරල පැහිලා
II ආරේ ගුණ නෑරේ
III දිවෙන් දිව ගාගෙන
IV ඇගේ ලේ වතුර වුණා
V කිරි ගහට ඇන්න වගේ

(ලකුණු 2x5 = 10යි)

**(08)පහත දැක්වෙන මාතෘකාවලින් 04ක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.**

I උපමාලංකාර
II රූපකාලංකාර
III ජනකවි
IV ළමා සාහිත්‍ය
V ජනකතා
VI එස් මහින්ද හිමි

(ලකුණු 5x4 = 20යි)